පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2024/02 (ii)

මගේ අංකය - එන්සීපී/සීඑස්/පීටී/ඒපී04/01-2023
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2024.03. 28

සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා
ව්‍යවස්ථාපිත අධිකාරි ප්‍රධානීන් වෙත.

**වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2023**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2024.02.22 දිනැතිව නිකුත් කරන ලද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2024/02 හා 2024.03.07 දිනැතිව නිකුත් කරන ලද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2024/02 (i) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

02. ඒ අනුව පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2024/02 හි 06 වන ඡේදය පහත පරිදි සංශෝධනය කරමි.

> "මෙහි සඳහන් තොරතුරු හා ආකෘතිය සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකතන අංක 071-7722454 මගින් අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම් ) ඇමතීමෙන් ලබා ගත හැකි බව වැඩිදුරටත් දැනුම් දෙමි "

03. තවද, පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2024/02 (i) හි 02 ඡේදය, "2023 ගිණුම් වර්ෂයට අදාල වාර්ෂික කාර්ය සාධන වාර්තාව මෙම චක්‍රලේඛයේ උපදෙස් හා ආකෘතිවලට අනුව සකස් එහි මෘදු පිටපත 2024.04.30 දින හෝ ඊට පෙර මෙම චක්‍රලේඛයේ 4.2 වගන්තියෙහි සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතු වන අතර, විගණන වාර්තාවද ඇතුලත් දෘඩ පිටපත, පිටපත් හතරකින් සකස් කර 2024.05.30 දින හෝ ඊට පෙර උතුරු මැද පළාත් සභාවේ සභාගත කිරීම සඳහා සභා ලේකම් කාර්යාලය වෙතද, ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීම සඳහා ආණ්ඩුකාරවර කාර්යාලය වෙතද, විගණකාධිපති වෙතද, පළාත් භාණ්ඩාගාරය වෙතද ඉදිරිපත් කළ යුතුවේ"ලෙස තවදුරටත් සංශෝධනය කරන අතර, උක්ත චක්‍රලේඛයේ අනෙකුත් උපදෙස් ඒ අයුරින්ම බලපැවැත්වෙන බවද දන්වමි.

(ආර්.එම්. ඩබ්.එස්.සමරදිවාකර),
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත්:-

01. සහකාර විගණකාධිපති, උතුරු මැද පළාත - කා.දැ.පි
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - කා.දැ.පි